# ලංසු සඳහා ආරාධනයයි (IFB)

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය
## ආරක්ෂක අමාත්‍යාංශය
## ශ්‍රී ලංකා යුද්ධ හමුදාව

## CLOTH RIPSTOP OLIVE GREEN MATERIAL - 58"/60" මීටර් 800,000 ක් ප්‍රසම්පාදනය

**කොන්ත්‍රාත් හඳුනාගැනීමේ අංකය : MOD/SLA/05/2021**

01. ශ්‍රී ලංකා යුද්ධ හමුදව වෙනුවෙන්, අමාත්‍ය මණ්ඩලය විසින් පත්කල ස්ථාවර ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් ශ්‍රී ලංකා යුද්ධ හමුදව සඳහා CLOTH RIP STOP OLIVE GREEN MATERIAL 58"/60" මීටර් 800,000 ක් මිලදී ගැනීම සඳහා සුදුසුකම්ලත් හා නිපුණතාපූර්ණ ලංසුකරුවන් වෙතින්, මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ.

02. ජාත්‍යන්තර තරගකාරී ලංසුකරණ ක්‍රියාපටිපාටිය (ICB) තුලින් මෙම ලංසුකරණය පවත්වනු ලැබේ.

03. උනන්දුවක් දක්වන ලංසුකරුවන්හට අවශ්‍ය වැඩිදුර විස්තර, ශ්‍රී ලංකාවේ, කොළඹ, ශ්‍රී ජයවර්ධනපුර යුද්ධ හමුදා මූලස්ථානයේ, යුධ උපකරණ මාස්ටර් ජනරාල් ශාඛාව වෙතින් ලබාගත හැක. දූරකථන අංක - 011-2432135, ඊමේල් : mgobranchemail@gmail.com අදාළ ලංසු ලේඛන, පහත සඳහන් ලිපිනයේදී ඕනෑම රාජකාරී දිනයකදී 0900 පැය හා 1500 පැය අතර කාලය තුළදී නොමිලයේ පරීක්ෂාකොට බැලිය හැක.

**සභාපති,**
**අමාත්‍ය මණ්ඩලය පත්කළ ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව,**
**ආරක්ෂක අමාත්‍යාංශය,**
**ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය,**
**ශ්‍රී ජයවර්ධනපුර,**
**කෝට්ටේ, ශ්‍රී ලංකාව.**
**දුරකථනය : 011-2390719**
**ෆැක්ස් : 011-2390720**

04. ලංසුකරුවන් විසින්, අදාළ වෙතොත්, 1987 අංක 3 දරන පොදු කොන්ත්‍රාත් පනත ප්‍රකාරව, එම ලියාපදිංචි සහතිකය, ලංසු සමග ඉදිරිපත් කළ යුතු බවට දැඩිව උපදෙස් දෙනු ලැබේ.

05. ලංසුකරු අපලේඛණගත වූ අයකු නොවිය යුතුය.

06. උනන්දුවක් දක්වන ලංසුකරුවන්හට, ආපසු නොගෙවන ගාස්තු ශ්‍රී ලංකා රුපියල් 65,000.00 (හැටපන්දහසක් පමණයි) මුදලින්, ආරක්ෂක අමාත්‍යාංශය වෙත ගෙවීමෙන් හා

**ප්‍රධාන මූල්‍ය නිලධාරී,**
**ප්‍රසම්පාදන ශාඛාව,**
**ආරක්ෂක අමාත්‍යාංශය,**
**ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය,**
**ශ්‍රී ජයවර්ධනපුර,**
**කෝට්ටේ, ශ්‍රී ලංකාව.**
**ඊමේල් : procurement@defence.lk**

යන ලිපිනයට ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන්, උනන්දුවක් දක්වන ලංසුකරුවන්හට, ඉංග්‍රීසි භාෂාවෙන් සකස් කරන ලද සම්පූර්ණ ලංසු ලේඛන කට්ටලයක් මිලදීගත හැක.

07. ලංසු, 2021.11.25 දින දක්වා වලංගු විය යුතුය.

08. ලංසු, අදාළ යොමු අංකය වන MOD/SLA/05/2021 සඳහන් කොට,

**සභාපති,**
**අමාත්‍ය මණ්ඩලය පත්කළ ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව,**
**ආරක්ෂක අමාත්‍යාංශය,**
**ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය,**
**ශ්‍රී ජයවර්ධනපුර,**
**කෝට්ටේ, ශ්‍රී ලංකාව.**

යන ලිපිනයට 2021.07.29 දින 1100 පැයට පෙර ලැබීමට සැලැස්විය යුතුය.

ප්‍රමාද ලංසු ප්‍රතික්ෂේප කෙරේ. අදාළ භාර ගැනීමේ කාලය අවසන් වූ වහාම පැමිණ සිටීමට කැමැත්තක් දක්වන ලංසුකරුවන්ගේ හෝ ඔවුන්ගේ නියෝජිතයන්ගේ ඉදිරියේ ලැබී ඇති ලංසු විවෘත කරනු ලැබේ.

09. මේ සම්බන්ධව පෙර - ලංසු හමුවක්, 2021.07.16 දින 1030 පැයට,

**යුධ හමුදා සෙලින්කෝ ගොඩනැගිල්ල,**
**අංක 167/30,**
**අවිස්සාවේල්ල පාර,**
**ඔරුගොඩවත්ත.**

යන ලිපිනයේදී පැවැත්වීමට නියමිතය.

10. සියලුම ලංසු සමග, ITB හි 20 වගන්තිය ප්‍රකාරව, වටිනාකම ශ්‍රී ලංකා රුපියල් මිලියන හයක් (ශ්‍රී ලංකා රුපියල් 6,000,000.00) වටිනාකමින් යුත්, ශ්‍රී ලංකා මහබැංකුව විසින් අනුමත කළ, ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වාණිජ බැංකුවක් විසින් නිකුත් කළ කොන්දේසි විරහිත හා ඒක්ෂණ බැංකු ඇපකරයක් වශයෙන් වූ ලංසු ඇපකරයක් බැගින් තිබිය යුතුය. එම ලංසු ඇපකරය 2021.12.23 දින දක්වා වලංගු විය යුතුය.

11. ඇමතිය යුතු අය

**යුධ උපකරණ මාස්ටර් ජනරාල් ශාඛාව,**
**ශ්‍රී ලංකා යුධ හමුදාව,**
**දුරකථන : 0094-11-2432135**
**ෆැක්ස් : 011-2432135**
**ඊමේල් :** mgobranchemail@gmail.com

**ප්‍රධාන මූල්‍ය නිලධාරී,**
**ආරක්ෂක අමාත්‍යාංශය,**
**ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය,**
**ශ්‍රී ජයවර්ධනපුර,**
**කෝට්ටේ, ශ්‍රී ලංකාව.**
**දුරකථනය : 0094-11-2439381**
**ෆැක්ස් : 0094-11-2390720**

12. ලංසුකරුවන් විසින්, ලංසු විවෘත කරනු ලබන අවස්ථාවට සහභාගි වීමට අපේක්ෂිත පුද්ගලයාගේ නාමය හා ජාතික හැඳුනුම්පත් අංකය / විදේශ ගමන් බලපත්‍ර අංකය, අදාළ ලංසු විවෘත කිරීමේ දිනයට අවම වශයෙන් රාජකාරී දින තුනකට (03) පෙර ආරක්ෂක අමාත්‍යාංශයේ ප්‍රධාන මූල්‍ය නිලධාරී වෙත ලිඛිතව දැනුම් දෙන ලෙසට උපදෙස් දෙනු ලැබේ.

13. සියලුම ප්‍රසම්පාදන අභියාචනා, සාර්ථක ලංසුකරු වෙත කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමේ අපේක්ෂාව රේඛීය අමාත්‍යාංශයේ ලේකම් විසින් දැනුම් දී දින 7 ක් ඇතුළත ඉදිරිපත් කළ යුතුවේ. සෑම අභියාචනයක්ම පහත සඳහන් ලිපිනයට යොමු කළ යුතුය.

**ලේකම්,**
**ආරක්ෂක අමාත්‍යාංශය,**
**ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය,**
**ශ්‍රී ජයවර්ධනපුර,**
**කෝට්ටේ, ශ්‍රී ලංකාව.**

සභාපති,
අමාත්‍ය මණ්ඩලය පත්කළ ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව,
ආරක්ෂක අමාත්‍යාංශය,
ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය,
ශ්‍රී ජයවර්ධනපුර,
කෝට්ටේ, ශ්‍රී ලංකාව.
2021.06.13